මුලටියන ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.
-------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 09 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු මාකඳුර සතිපොළ හා කඩකාමර සංවර්ධනය කිරීම සඳහා දරන ලද රු.2,444,855 ක වියදම, ප්‍රාග්ධනීත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති හා ණයහිමි ශේෂය රු.205,589 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ණයගැති හා ණයහිමි ශේෂයන් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | ඉකුත් වර්ෂය අවසානය වන විට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදලට ගෙවිය යුතු රු.1,193,249 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ශේෂය සනාථ කරගත් පසු ණයහිමි ප්‍රතිපාදන වෙන්කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

#### (ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 157,704,256 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, අසමානතා එකතුව රු. 4,556,221 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2013 වර්ෂයේ සිට නොවෙනස්ව ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ පවතින රු.36,289 ක බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | කාලයක් තිස්සේ පැවත එන ශේෂයක් බැවින් සොයාගත නොහැකි බව. |

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 248,424,741 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 143 | ආපසු ගෙවියයුතු තැන්පත් ලෙජරයේ මාසික එකතුව ප්‍රධාන ලෙජර ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | රීති ප්‍රකාරව කටයුතු කරමි. |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම්, අතිරික්තතා හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | රීති ප්‍රකාරව කටයුතු කිරිමට පියවර ගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | රීති 204 | ඌනතාවයන් සම්බන්ධයෙන් සතුටුදායක පැහැදිලි කිරීමක් ලබාගත නොහැකි අවස්ථාවක භාණ්ඩවල වටිනාකම අදාළ නිලධාරියා වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | එකතුව රු.243,516 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 30/206 හා 2016 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛය | සභාව සතු වාහන 11 ක් සම්බන්ධව ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේදී කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.429,840 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු. 6,673,497 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,341,332 | 1,432,693 | 1,435,706 | 73,218 | 626,000 | 1,393,058 | 1,393,058 | 76,231 |
| කුලී | 11,287,400 | 5,445,270 | 6,199,638 | 630,816 | 4,445,600 | 4,963,939 | 4,057,086 | 1,385,184 |
| බලපත්‍ර ගාස්තු | 1,250,180 | 524,905 | 524,905 | 10,450 | 1,100,540 | 597,502 | 597,502 | 10,450 |
| වෙනත් ආදායම් | 13,875,770 | 9,071,437 | 12,330,743 | 13,487,902 | 12,188,750 | 12,482,503 | 10,653,369 | 16,747,208 |
| එකතුව | 27,754,682 | 16,474,305 | 20,490,992 | 14,202,386 | 18,360,890 | 19,437,002 | 16,701,015 | 18,219,073 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) **වරිපනම් බදු** | | |
| සභාව විසින් වරිපනම් බදු අයකිරීමට අපේක්ෂිත ප්‍රදේශ හඳුනාගෙන සභා යෝජනාවකින් සම්මත කර, ඒ සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) ප්‍රකාරව පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග සිදුකර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු අයකළ හැකි දේපළ හඳුනාගෙන වරිපනම් බදු අය කළ යුතු වේ. | 2020 වර්ෂය තුල දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරිමට අදාල සැලසුම් සකස් කර ඇත. |
| (ආ) **අක්කර බදු** | | |
| ආරම්භක හිඟය රු.83,528 ක් වූ අතර, රු.21,683 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.105,136 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.31,918 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.73,218 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ආදායම් පරීක්ෂක විසින් අදාල පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර හිඟ මුදල් අය කර ගැනිමට කටයුතු කර ඇත. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛ අංක දපපා/පපාකො/2010/01 හි 06 ඡේදය ප්‍රකාර වසර 5 කට වරක් තක්සේරුගත බදු මුදල නව තක්සේරුවක් මඟින් සංශෝධනය කළයුතු වුවත් මාකඳුර සතිපොල කඩ කාමර 29 ක් සම්බන්ධව චක්‍රලේඛ ප්‍රකාරව කුලී අය කිරිමට කටයුතු කර නොතිබුණ අතර, 2008 තක්සේරුව පදනම් කරගෙන කඩකුලී අයකිරීම් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කඩිනමින් තක්සේරු කුලි ලබා දීමට කටයුතු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. |
| (ආ) මාකඳුර සතිපොළ කඩ කාමර 10 කින් 2016 වර්ෂයට පෙර සිට හිඟව පැවති රු.318,850 ක මුදලක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතු වේ. | ඉදිරියේදී හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 වෙනත් ආදායම්

--------------------

උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | --------------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වරෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.489,651 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.12,998,251 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් ලබා ගැනීම සඳහා ප්‍රධාන ලේකම් වෙත ලිඛිතව දන්වා යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------- |
| ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණද 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ දකුණු පළාත් සංවර්ධන ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 08 ක් සඳහා රු.1,670,583 ක මුදලක් සභාවට ලැබී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත කර්මාන්ත කඩිනමින් ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සවිකර ඇති වීථි පහන් නඩත්තු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව වෙත පැවරීම සම්බන්ධයෙන්, ලංකා විදුලි බල මණ්ඩලයේ මාතර ප්‍රධාන විදුලි ඉංජිනේරුගේ අංක දප/මා/ලි10/ වීථිපහන් නඩත්තු හා 2019 මාර්තු 26 දිනැති ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සභා බල ප්‍රදේශයේ සවිකරන ලද වීථි පහන් 1454කට නඩත්තු වියදම් රු.1,112,300 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකිවී තිබුණි. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කරමි. |
| (ආ) | 2019 ජනවාරි 27 දින සභාව සතු කැබ් රථයක් අනතුරට පත්වී අලුත්වැඩියාවට රු.2,326,177 ක් වැයකර තිබූ අතර, රක්ෂණය මගින් ආවරණය නොකළ රු.188,120 ක මුදල රියදුරුගෙන් අයකර ගැනීමට මු.රෙ.104 (1) යටතේ පත්කළ කමිටුව විසින් තීරණය කර තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද අනතුරට වගකිවයුතු රියදුරු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග නොගෙන සභාව සතු වාහන 03 ක සේවයට යොදවා තිබුණි. | අදාළ පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්ගෙන් ලැබී ඇති ලිඛිත උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පරිසර ආරක්ෂන බලපත්‍ර ලබා නොගත් ආයතන 29 ක් පැවති අතර එම ආයතන මගින් පරිසරයට වන හානිය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබුණි. තවද බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 127,600 ක් අයකරගෙන නොතිබුණි. | සුදුසුකම් පරීක්ෂාකර කඩිනමින් පරිසර බලපත්‍ර ලබා දිය යුතු වේ. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 04 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 06 ක්වූ | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු | අතිරික්ත නිලධාරින් යටතේ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර පළාත් |

| | | | |
|---|---|---|---|
| | අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | විධිමත් කරගැනීමට හා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | පාලන දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරකි. ඉතිරි අතිරික්ත තනතුරු සඳහා ඉදිරියේදි අවශ්‍ය කටයුතු කරන අතර ප්‍රාථමික ශ්‍රේණියේ 2020 ජනවාරි 22 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි පුරප්පාඩු සඳහා බඳවා ගැනිම් නැවත දැනුම්දෙන තුරු අත්හිටුවීමට තීරණය කර ඇති බව වාර්තා කර ඇති බැවින් ඊට ආදාලව කටයුතු සිදු කරමි. |
| (ආ) | සභාවේ විදුලි කාර්මික තනතුර සඳහා සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවෙකු යොදවා ගෙන රක්ෂණ ආවරණයක් ලබාදීම සඳහා රක්ෂණ ගාස්තු රු.22,318 ක් ගෙවා තිබුණි. එසේ වුවද විදුලි කාර්මික තනතුරේ සේවයේ යෙදීමට අදාලව සුදුසුකම් ලැබු සහතිකයක්ද විගණනයට ඉදිරිපත් නොවුණි. | අදාළ ආයතනයෙන් සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | NVQ 3 සහතිකය ලබා ගැනිම සඳහා 2019 දෙසැම්බර් 02 දින අදාල පරීක්ෂණයෙන් සමත්ව ඇති බව ආදල ආයතනයෙන් දැනුම්දී ඇති අතර එකි සහතිකය ලැබී නොමැත. |
| (ඇ) | **සේවක ඇප**<br>------------<br>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 180 ප්‍රකාරව ඇප ලබාගත යුතු නිලධාරීන් 05 කුගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඇප තැන්පත් ලබාගැනීමට කටයුතු කරමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | --------------------------- |
| විවිධ දූරකථන සමාගම් විසින් ස්ථාපිත කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 08 ක් සඳහා නියමිත ගාස්තු අයකර අනුමැතිය ලබා දීමට කටයුතු කර නොතිබූ අතර සම්ප්‍රේෂණ කුළුණු 06 කින් වාර්ෂික බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කටයුතු සිදු කරමි. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දකුණු පළාත් සභා ධීවර. පරිසර කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මුලටියන නගරයේ හරිත කලාප හා පරිසර අලංකරණය සඳහා රු.172,700 ක් වැයකර සකස් කළ මල් වැල් ආධාරක කණු 30 නියමිත ප්‍රමිතියට නොවූ අතර කණුවක නියමිත උස නොතිබීම, විදුලි පහන් හා විදුලි කාර්මික උපාංග සවිකර නොතිබියදී කාර්මික නිලධාරී විසින් ගෙවීම නිර්දේශ කර තිබුණි. මල්පැල නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා අදාල අරමුණද ඉටු වී නොතිබුණි. | නියමිත ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුවේ. | භාණ්ඩ මිලදී ගැනීමක් හෙයින් ඒ සඳහා අවශ්‍ය සියළු පිරිවිතරයන් රූප සටහන් මගින් ලබාදුන් අතර මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා ඇස්තමේන්තු සකස් කිරිම සිදු කිරිමට තාක්ෂණ සේවා නිලධාරින්ට හැකියාවක් හෝ බලයක් නොමැති නිසා ඇස්තමේන්තු සකස් කිරිමක් සිදු නොකරන ලද අතර විගණන නිරීක්ෂණයට ලක් වන කාල සීමාව තුල වර්ෂාව රහිත අධික වියළි කාලගුණයක් පැවැති අතර මල් වැල් වර්ධනය අඩාල වී තිබුණි. |